**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා

ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි **128(1)** ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.2.1<br>2.7 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු<br>2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2(ආ)<br>2.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව<br><br>(මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරීම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරීම) | 1. අවිධිමත් ගනුදෙනු<br>2. කළමනාකරණ අඩුපාඩු | 2.3<br>2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 11 ක් පැවැති අතර, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බූදල් සහ පිහිටුවා ඇති භාරවලට අදාළව 1918 අංක 4 හා අංක 01 දරන පනත් මඟින් සංශෝධිත 1917අංක 09 දරන භාර ආඥා පනත මඟින්ද 1931 අංක 11, 1938 අංක 59 හා 1983 අංක 41 දරන පනත් මඟින් සංශෝධිත 1922 වර්ෂයේ අංක 01 දරන මහා භාරකාර ආඥා පනත යටතේ රැස් කර තිබූ මූලධන ආදායම්,ආයෝජන ආදායම්, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු රු.11,209,507 ක් 2017 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණද මෙම ආදායම් රැස් කිරීම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) මහා භාරකාර තැන වෙත විවිධ බූදලයන් යටතේ ප්‍රමාණාත්මක කෘෂිකාර්මික ඉඩම් 12 ක් පැවරී ඇති අතර ඒවා විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමෙන් ඉටු කිරීම අපේක්ෂා කෙරේ. මෙසේ පැවරී ඇති එන්.ඩී.එස්. සිල්වා බූදලයට අයත් වනස්ගල්ල වත්ත හා ලබුහේනවත්ත සම්බන්ධයෙන් අපේක්ෂිත ආදායම හා වියදම ඇස්තමේන්තු කර 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය තුළදී වනස්ගල්ල වත්තෙන් රු.23,294 ක ලාභයක් හා ලබුහේන වත්තෙන් රු.232,915 ක අලාභයක් ලබා ගෙන තිබුණි.

## 2.2 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

----------------------------

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් කැඳවා තිබූ පිරියත, යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ පිළිබඳ තොරතුරු ලබා දී නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

-----------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2018 අගෝස්තු 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන වතු 12 ට අදාළව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබීම මීට හේතු වී තිබුණි.

## 2.3 අවිධිමත් ගනුදෙනු

---------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### 2.3.1 සඳහිරු සෑය භාරය

---------------------

කොළඹ 03 බාලදක්ෂ මාවත, අංක 5/15 හි හමුදා සම්බන්ධීකරණ නිලධාරී ස්ථාපක වශයෙන්ද, ආරක්ෂක භාරකරු වශයෙන් මහා භාරකාර තැනද පත් කරමින් 2011 ජනවාරි 14 දින මහා භාරකාර දෙපාර්තමේන්තුවට "සඳහිරු සෑය" භාරය ආරම්භ කිරීම සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි. ත්‍රස්තවාදය මුලිනුපුටා දමා ලබාගත් ජනතා විජයග්‍රහණය අනුස්මරණය කිරීම පෙරදැරිව ත්‍රිවිධ හමුදා රණවිරුවන්ගේ පූර්ණ දායකත්වය ලබාගනිමින් පළාත්බදව ඉදිකෙරෙන චෛත්‍යය 9 ක වැඩසටහනේ පළමුවන චෛත්‍ය ලෙස "සඳහිරු සෑය" ඉදිකිරීමට ආධාර උපකාර ලබා ගැනීම මෙම භාරය පිහිටුවීමේ අරමුණ වී තිබුණි. භාරය සඳහා පුද්ගලයන් 4 දෙනෙකුගෙන් සමන්විත පාලන භාරකාර මණ්ඩලයක් පත්කර තිබුණි. මේ සම්බන්ධව කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අවස්ථා 2 කදී රු.මිලියන 3 ක් හා රු.මිලියනයක් බැගින් එකතුව රු.මිලියන 4 ක් වූ පරිත්‍යාග ලබා දී තිබුණි. ඉන් රු.මිලියන 3 ක් භාර ඔප්පුව අත්සන් තබා නීත්‍යානුකූලව භාරය ස්ථාපිත කිරීමට මාස 01 දින 13 කට පෙර එනම් 2010 නොවැම්බර් 29 දින මෙම භාරයේ නමට ලැබී තිබුණි.

(ආ) භාර ඔප්පුව අත්සන් කර ගිවිසුමට එළඹීමට පෙර එනම් 2010 දෙසැම්බර් 16 දින රු.මිලියන 3 ක මුදලක් දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමෙන්ද රු.මිලියන 2.72 ක මුදලක් මෙයට අදාළ නොවූ ආගමික හා සමාජ සේවා පොදු භාර අරමුදලෙන්ද "සඳහිරු සෑය" ඉදිකිරීමේ කටයුතු

සඳහා යැයි දක්වමින් පෞද්ගලික සමාගමකට, හිමිනමකට හා හමුදා නිලධාරීන් දෙදෙනෙකුගේ පෞද්ගලික නමට මුදාහැර තිබුණි.

(ඇ) භාර ඔප්පුවේ 9 වගන්තියේ (අ) ඡේදයට අනුව ස්ථාපක ඇතුළු පාලන භාරකාර මණ්ඩල සාමාජිකයන්ගෙන් අවම වශයෙන් දෙදෙනෙකුගේ අත්සන් සහිතව ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමකට යටත්ව මෙකී මුදල් නම් කරනු ලබන පුද්ගලයෙකු හෝ ආයතනයක නමින් ලියන ලද චෙක්පතකින් මුදාහැරිය යුතුය. භාර ඔප්පුවේ 9 වගන්තියේ (අ) ඡේදයට පටහැනිව ලිඛිත ඉල්ලීම් ද නොමැතිව මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් ඉහත (ආ) ඡේදයේ සඳහන් මුදලද ඇතුළත්ව අවස්ථා 8 කදී රු.මිලියන 7.18 ක මුදලක් (ආ) ඡේදයේ සඳහන් පාර්ශව සහ තවත් යුදහමුදා මේජර්වරයෙකුට මුදාහැර තිබුණි. මේ ආකාරයට පරිත්‍යාග හා අනෙකුත් භාර බූදල් සතු මුදල් යොදා විවිධ පාර්ශවයන්ට ගෙවන ලද මුදල් සම්බන්ධයෙන් කාර්යසාධනය පිළිබඳ පසු විපරම් කර නොතිබුණු අතර වියදම්වලට අදාළ ප්‍රගති වාර්තා හෝ ලබාගෙන නොතිබුණි.

(ඈ) 2011 පෙබරවාරි මස 01 දින දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන විසින්, සඳහිරු සෑය ගොඩනැගීම සඳහා භාරගෙන තිබුණි. එහෙත් මෙම ඉඩමේ කිසිදු ඉදිකිරීමක් හෝ සංවර්ධන කටයුත්තක් සිදු වී නොතිබීම හේතුවෙන් නැවතත් 2015 මාර්තු 17 වන දින එම ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගෙන තිබුණි. ඒ අනුව නීත්‍යානුකූලව හිමිකමක් නොමැති ඉඩමක "සඳ හිරු සෑය" ඉදිකිරීමට සැලසුම් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) භාරයේ මුදල් නොමැතිව තිබියදී දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් සිදු කිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට "සඳහිරු සෑය" භාරයේ රු.514,432 ක හර (ඍණ) ශේෂයක් ඇති වී තිබුණි.

### 2.3.2 නිහාල් පීරිස් බූදලය

---------------------

රත්මලාන, දෙවන පටුමගේ අංක 57 දරණ ස්ථානයේ පදිංචිව සිට මියගිය නිහාල් පීරිස් යන අයගේ අන්තිම කැමති පත්‍රයක් රහිත බූදලය සඳහා ගල්කිස්ස දිසා අධිකරණයේ 2007 ක් වූ ඔක්තෝබර් 02 වන දින අංක 2117/05/ටී දරණ නඩු තීන්දුවෙන් මහා භාරකාර තැන වෙත නිහාල් පීරිස් බූදලය සම්බන්ධ ප්‍රොබේට් බලතල ලැබී තිබුණි.

මෙම දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) රත්මලාන 2 වන පටුමග අංක 57 හි පිහිටි නිවස**

2007 දෙසැම්බර් 06 දිනැතිව මහා භාරකාරතැන විසින්, මෙම නිවස සුළු අලුත්වැඩියාවන් කර කුලියට හෝ බද්දට දී ආදායමක් ලබාගත හැකි බවත්, එම ආදායම නිහාල් පීරිස් මහතාගේ මන්ද මානසික තත්වයෙන් පසුවන දරුවන් දෙදෙනාගේ සුබ සිද්ධිය සඳහා යෙදවිය හැකි බවත් ගල්කිස්ස දිසා අධිකරණය වෙත දන්වා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් අදාළ දේපළ සම්බන්ධ අද්මිනිස්ත්‍රාසි බලතල ලබාගෙන තිබුණ ද, එම දේපළ නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය පියවර නොගැනීම නිසා 2017 අගෝස්තු මාසය එනම් විගණිත දින දක්වා මෙම නිවස අලුත්වැඩියා කර බද්දට හෝ කුලියට දීමෙන් ලබාගැනීමට හැකි ව තිබූ වසර 10 ක ආදායම අහිමි වී තිබුණි.

**(ආ) පර්චස් 20 ක් වූ කඳවල වත්ත ඉඩම (බ්ලොක් අංක 37)**

බූදලයට අයත් පර්චස් 20 ක් වූ කඳවල වත්ත ඉඩම දෙපාර්තමේන්තුව විසින් පර්චස් 5 ක් හා 15 ක් වශයෙන් පිළිවෙලින් 37 B හා 37 A වශයෙන් කොටස් කරමින් අංක 4245 දරණ පිඹුර සකස් කර

තිබුණි. පර්චස් 15 ක ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.9,000,000 ක ට තක්සේරු කර තිබූ අතර ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් මෙම ඉඩම රු.8,775,000 කට විකුණා තිබුණි. එය රජයේ අවම තක්සේරු මුදලට වඩා රු.225,000 ක් අඩු වටිනාකමක් ගෙන තිබුණි. තවද ඉතිරිව තිබිය යුතු පර්චස් 5 ක ඉඩම් කොටස පිළිබඳ තොරතුරුද අදාළ ගොනුව තුළ නොතිබුණි.

**(ඈ) කොටහේන, වාසල පාර, වරිපනම් අංක 65/18 දරන පර්චස් 1.99 ක් වූ දේපළ**

2010 මැයි 25 දිනට මෙම ඉඩම රු.1,800,000 කට තක්සේරු කර තිබුණි. මෙම දේපළ රු.3,000,000 කට ඒ වන විටත් නිවසේ පදිංචිව සිටි පුද්ගලයාට විකිණීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණි. 2010 නොවැම්බර් මස 19 දිනදී ගල්කිස්ස දිසා අධිකරණය වෙතින් මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත මෙම දේපළ රු.මිලියන තුනකට විකිණීම සඳහා අවසර ලබා දී තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුව විසින් උසාවි අවසරය ලැබීමට පෙර 2010 අගෝස්තු 19 දින වන විට මෙම දේපළ වෙනුවෙන් පදිංචිකරුගෙන් රු.මිලියනයක මුදලක් ලබාගෙන තිබූ අතර එය මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

**2.4 විසඳා නොතිබුණු විගණන ඡේද**

---------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| **2016** | **3.6.1(අ)** | **ඩී.වී.පී.විජේසිංහ දහම් සෙවණ භාරය**<br>ගල්කිස්ස පදිංචි ඩී.ජී.ඩබ්. විජේසිංහ මහතා විසින් මහා භාරකාර තැන භාරකරු ලෙස නම් කරමින් රු.25,000 ක ආරම්භක මුදලක් හා පානදුර ප්‍රදේශයේ පිහිටි පර්චස් 37.5 ක ඉඩමක් පවරා 2013 ජනවාරි 31 දින " ඩී.වී.පී.විජේසිංහ දහම් සෙවණ" නමින් භාරයක් පිහිටුවා තිබුණි.මෙහි අරමුණ ලෙස මෙහෙණි සස්නේ චිරස්ථිතිය සඳහා ධර්මායතනයක් පිහිටුවීම සහ එය පවත්වාගෙන යාම සඳහන් කර තිබුණි.<br>මෙම ඉඩම මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට පෙර එහි සිල්මාතා ආරාමයක් ඉදිකිරීමට අධිකරණ අවසරය ද ලබා ගෙන තිබුණි. මෙම ඉදි කිරීම සඳහා මූලධනයෙන් ලැබෙන පොලිය ප්‍රමාණවත් ද යන්න පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු කර නොතිබුණි. |
| | **3.6.1(ආ)** | **චාන්දනී හේමන්තා පෙරේරා මෙනෙවියගේ දේපළ කළමනාකරණය**<br>කොළඹ දිසා අධිකරණයේ අංක 06/2005/ එල්ජී දරන නඩුවේ තීන්දුව මත 2006 ඔක්තෝබර් 04 දිනදී චාන්දනී හේමන්තා පෙරේරා මෙනෙවියගේ රෝගී තත්ත්වය සුව වන තුරු, ඇගේ බූදලය සඳහා දේපළ ආරක්ෂක වශයෙන් ද පුද්ගල ආරක්ෂක වශයෙන් ද මහා භාරකාර තැන පත්කර තිබුණු අතර ඇගේ නඩත්තුව සඳහා අධිකරණයෙන් නියම කරන මුදලක් වියදම් කිරීමට බලය ලබාදී තිබුණි. අධිකරණය මගින් පත් කරන අවස්ථාවල මන්ද මානසික අයගේ දේපළ කළමනාකරුවෙකු ලෙස මහාභාරකාරවරයා කටයුතු කළ යුතු වුවත් එවන් පුද්ගලයෙකුගේ පුද්ගල ආරක්ෂක වශයෙන් කටයුතු කිරීමට උක්ත ආඥාපනතින් ප්‍රතිපාදන සලසා නොතිබුණි. |

**2016** **3.6.2(අ)** **යූ.ඩී.බී.ද සිල්වා බූදලය**

2010 අප්‍රේල් 01 දින නැසීගිය යූ.ඩී.බී.ද සිල්වා මහතාගේ 2001 ජූනි 29 දිනැති අංක 10821 දරන අන්තිම කැමති පත්‍රය මගින් ඒ මහතාගේ බූදලය සඳහා භාරකරු වශයෙන් මහා භාරකාර තැන නම් කර තිබුණි.

බූදලයේ අර්ථලාභීන් සඳහා නිවසක් ඉදිකර දෙන ලෙස අන්තිම කැමති පත්‍රයේ සඳහන් කර තිබුණද නිවස මිලදී ගෙන නොතිබුණි. මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 7 ක දී බූදලයේ මූලධනයෙන් ගමන් ගාස්තු හා නීතිඥ ගාස්තු වශයෙන් එකතුව රු.247,274 ක් වියදම් කර තිබුණි.

බැංකු මුදල් වටිනාකම රු.41,079,003 ක් ලෙසද, ස්ථිර තැන්පතුවල ඇති වටිනාකම රු.110,513,662 ක් ලෙසද සඳහන් වුවත්, ලිපිගොනු අනුව බැංකු මුදල් වටිනාකම රු.50,179,827 ක්ද ස්ථිර තැන්පතු වටිනාකම රු.58,000,000 ක් වී තිබුණි.

බූදලයේ නීතිමය කටයුතු අවසන් නොවූවද බූදලයෙන් රු.2,038,430 ක් නීති ගාස්තු වශයෙන් ගෙවා තිබුණි.

බූදල්කරුගේ අරමුණු වලට පටහැනිව රු.484, 946 ක පුනාහාධාර ගෙවා තිබුණි.

**2016** **3.7(අ)** **ගම්පොල නගර සංවර්ධනය හා කසළ බැහැර කිරීමේ කාර්යයට චීන රජයෙන් ලද මුදල්**

ගම්පොල නගර සංවර්ධනය සහ කසළ කළමනාකරණය උදෙසා චීනයේ ලිංසැන්ග් (Lingsang) නගර සභාවේ නගරාධිපතිවරයා සමඟ ගම්පොල නගර සභාවේ හිටපු නගරාධිපතිවරයා 2011 ජූලි 07 වන දින ගිවිසුමක් අත්සන් කර තිබුණි. ඒ අනුව 2012 ඔක්තෝබර් 19 වන දින ඇමරිකන් ඩොලර් 159,604.18 හෙවත් රු.20,426,675 ක් මහා භාරකාර තැනගේ නිල බැංකු ගිණුමට එවා තිබුණි. එම මුදලින් මහා භාරකාර තැන විසින් රු.20,814,322 ක් විවිධ කාර්යයන් සඳහා අවිධිමත් ලෙස වියදම් කර තිබුණි.

**3.7(ආ)**

**සිසිල් අර්නස්ට් වනිගසූරිය මහතාගේ බූදලය සම්බන්ධයෙන් වූ විගණනය**

අංක 1503 දරන අන්තිම කැමති පත්‍රය මගින් සිය බූදලය සතු සියලු දේපළ විකුණා ලැබෙන මුදල් "සිසිල් වනිගසූරිය" භාරය නමින් භාරයක් පවත්වාගෙන යන ලෙස දක්වා 1999 නොවැම්බර් 28 දින මියගිය සිසිල් අර්නස්ට් වනිගසූරිය මහතාගේ බූදලය මහා භාරකාර තැනට පවරා තිබුණි. රු.මිලියන 79 කට හා රු.9,043,935 කට විකිණූ ඉඩම් දෙකකින් ලද මුදල් සිසිල් වනිගසූරිය බූදල් ගිණුමට ගිණුම්ගත කිරීම පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

කඩවත ඌරලිංකනත්ත නමැති ඉඩමේ නොවිකිණී ඉතිරි වූ අක්කර 01 රූඩ් 4 පර්චස් 38 ක ඉඩම් ප්‍රමාණය, ස්ථාන 04 ක පිහිටි එකතුව අක්කර 03 රූඩ් 03 පර්චස් 8 ක්ද ,ස්ථාන 2ක පිහිටි ප්‍රමාණය නිශ්චය කර නොතිබුණු දේපළද, කොලොන්නාව නගරසභා සීමාව තුළ සේදවත්තේ පැවති ඉඩම් සම්බන්ධයෙන්ද ප්‍රොබේට් බලපත්‍රය ලැබී වර්ෂ 11 ක් ගතවී තිබුණු නමුත් එම දේපළ විකුණා මුදල් සිසිල් වනිගසූරිය භාරයට බැර කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

3.7(ඇ) 2007 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් රු.98,182,155 ක් ලෙස දක්වා තිබුණද දේපළ ලැයිස්තුව අනුව මුළු වත්කම් වල අගය රු.111,246,658 ක් ලෙස දක්වා තිබුණි. රු.13,064,503 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

**ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ බූදලය**

**---------------------------------------------------**

1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මිය විසින් ශ්‍රී ලංකාවේ ස්ථාන 3 ක පිහිටි එකතුව රූඩ් 3 පර්චස් 35.8 ක ඉඩම් හා එම ඉඩම්වල පිහිටි නිවාස ගොඩනැගිලි 3 ක් විකුණා ලැබෙන මුදල් ද පෞද්ගලික බැංකුවක පැවැති රු.54,476 ක මුදල ද උරුමකරුවන්ට /අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස ශ්‍රී ලංකා මහා භාරකාරවරයාව 1975 වර්ෂයේ දී නම් කර තිබුණි.

මෙම දේපළ විකිණීමෙන් ලැබුණු රු.69,066,000 කින් රු.25,615,209 ක උරුමකරුවන් හා අර්ථලාභීන් 20 දෙනෙකුට ලබා දී තිබුණි. ඉතිරි වූ රු.43,450,791 ක් වූ මුදල 2016 ජනවාරි 31 දින වන විට වර්ෂ 5 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද අනෙක් උරුමකරුවන්ට ගෙවා නොතිබුණි.

**3.8(ආ)** කොළඹ 05 ක්ලාසන් පෙදෙස, පිහිටි රූඩ් 01, පර්චස් 05.94 ක වර්ග ප්‍රමාණයකින් යුත් දේපළ විකිණීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. එදින වන විට මෙම දේපළ විකිණීම සඳහා වර්ෂ 40 කට අධික දීර්ඝ කාලයක් ගතකර තිබුණි.

**2016** **නාරාහේන්පිට ශ්‍රී අභයාරාම විහාරස්ථානයට වන්දි මුදල් ගෙවීම**

------------------------------------------------------------------------

උක්ත විහාරස්ථානයේ ඉඩම්, මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගැනීම වෙනුවෙන් රු.මිලියන 33.36 ක වන්දියක් 2007 සහ 2008 වර්ෂවලදී මහා භාරකාරවරයා වෙත ලබා දී තිබුණි. එම වන්දි මුදලෙන් කොටසක් වූ රු.මිලියන 15 ක් විහාරාධිපති නොවන විහාරවාසී හිමිනමකගේ ඉල්ලීමට අනුව 2007 දෙසැම්බර් 06 දින ගෙවා තිබුණි. ඉහත වන්දි මුදල් නිදහස් කිරීම වෙනුවෙන් විහාරස්ථානයේ සංවර්ධන කටයුතු වලට අදාළ වියදම් ඇස්තමේන්තු, ඉංජිනේරු ඇස්තමේන්තු, ඉංජිනේරු සැලසුම් යනාදී ලියවිලි බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

වන්දි මුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජනයෙන් 2015 පෙබරවාරි 09 වන දින වන විට පොලී ලෙස රු.මිලියන 24.88 ක් ලැබී තිබුණු නමුත් රු.මිලියන 34.11 ක් විහාරවාසී හිමියන් වෙත නිදහස් කිරීම තුළින් නීත්‍යානුකූල නොවන ලෙස රු.මිලියන 9.23 ක ගෙවීමක් කර තිබුණි.

**2.5** **කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** **ඩී. ජේ. ඩී. ජේ. අබේසේකර බූදලය**

**----------------------------------------**

කොළඹ 07, බාන්ස් පෙදෙසේ අංක 93 නිවසේ පදිංචිව සිට 1965 අගෝස්තු මස 10 දින මිය ගිය ජොහානා ඩයස් ජයවීර අබේසේකර මහත්මිය විසින් 1965 අගෝස්තු 06 දින ලියන ලද

අංක 92 දරන අන්තිම කැමති පත්‍රයට අනුව ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන පොල්මංකරු ලෙස පත්කර තිබුණි. කොළඹ දිසා අධිකරණයේ අංක 22469 දරණ නඩුවෙන් 1968 මාර්තු 31 දින මහා භාරකාර තැන වෙත ප්‍රොබේට් බලපත්‍රය හිමි වී තිබුණි.

මෙම බූදලය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාව අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** බටපොල පිහිටි වරිපනම් අංක 23 හා 25 දරන කඩකාමර 2 හා ඇල්පිටිය, කුරුඳුගහ හැතැප්ම බටපොල පාර අංක 33/1 දරණ ඉඩම් කොටස

**(ii)** මෙම කඩකාමර මිලදී ගන්නා ලෙස බදුකරුවන් දැනුවත් කර තිබුණ ද මේ දක්වා ප්‍රතිචාර ලැබී නොතිබුණි. අංක 23 දරන කඩකාමරය සඳහා 2015 දෙසැම්බර් 31 දිනට හිඟ බදු මුදල රු.154,880 කි. පර්චස් 23.125 ක් වූ ඇල්පිටිය, කුරුඳුගහ හැතැප්ම බටපොල පාර අංක 33/1 දරණ ඉඩම් කොටස රු.මිලියන 2.30 ක් වූ තක්සේරු වටිනාකමට පදිංචිකරුට මිලදී ගන්නා ලෙස දන්වා තිබුණද 2018 අප්‍රේල් 25 දින වන විටත් මිල දී ගෙන නොතිබුණි. 2015 ජුනි 30 දිනට හිඟ බදු මුදල රු.143,400 කි. එදින සිට විගණිත දින දක්වා තවත් වසර 2 ක කාලයක් ගත වී තිබුණ දළකතුව රු.298,280 ක් වූ අයවිය යුතු හිඟ බදු මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. එමෙන්ම විධිමත් බදු ගිවිසුම් ද නොතිබුණි.

**(iii) අංක 314 දරණ පිඹුරේ ජී අක්ෂරය දරන ඉඩම් කැබැල්ල**

තක්සේරු වටිනාකම රු.710,000 ක් හා පර්චස් 11.86 ක් වූ මෙම ඉඩම පුවත්පත් දැන්වීමක් පළකර වැඩිම ඉල්ලුම්කරු වූ , 2004 ජනවාරි සිට 2010 මැයි දක්වා වසර 05 ක කාලයක් දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරිනියකට රු.595,372 ක මුදලකට 2012 මාර්තු 29 දින වන විට විකුණා තිබුණි. රජයේ තක්සේරු වටිනාකමට වඩා අඩු මිලකට දේපළ විකුණා තිබීම නිසා බූදලයට රු.114,628 ක අලාභයක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.

**(iv) නුගේගොඩ කන්ද අද්දර කට්ටිය නොහොත් ඉහල කන්ද ඉඩම**

මෙම ඉඩමට අදාළ බෙදුම් නඩුවේ අවසන් තීන්දුව පරිදි 2013 අගෝස්තු 26 දින රූඩ් 01 පර්චස් 26.6 ක් මහා භාරකාරවරයාට හිමිව තිබුණි. විගණිත දින දක්වා බූදල්කරුගේ අරමුණු ඉටුකිරීම සඳහා, මෙම ඉඩම සංවර්ධනය කිරීමට හෝ තක්සේරු වාර්තා ලබාගෙන විකිණීමට හෝ බදු දීමට හෝ අවශ්‍ය කිසිදු පියවරක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

**(ආ) ආර්.එල්.එච්. චන්ද්‍රසේකර බූදලය**

අනුරාධපුර නගරයේ කුරුණෑගල පාරේ පදිංචිව සිටි ආර්.එල්.එච්. චන්ද්‍රසේකර යන අයගේ බූදලය සම්බන්ධයෙන් වූ නඩු අංක T 01/99 යටතේ එම බූදලය රු.1,058,867 ක වටිනාකමකට තක්සේරු කර 1999 ජනවාරි 14 දින අන්තිම කැමති පත්‍රය හා ඇස්තමේන්තුව අධිකරණයට ඉදිරිපත් කර තිබුණි. විරෝධතා පෙත්සම් හේතුවෙන් අනුරාධපුර දිසා අධිකරණ විනිසුරු විසින් 2003 ජුනි 04 දින සීමිත ප්‍රොබේට් බලපත්‍රයක් මහා භාරකාර තැන වෙත ප්‍රදානය කර තිබුණි. මෙම බූදලය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මෙම බූදලයට අයත් ගොඩ මඩ ඉඩම් ප්‍රමාණය කොතෙක්දැයි නිශ්චිතව තහවුරු කෙරෙන පිඹුරුපත් මැණුම්පත් කිසිවක් ගොනුගත කර නොතිබුණි. ආර්.එල්.එච්.

චන්ද්‍රසේකර මහතා මියගොස් වසර 19 ක් ඉක්ම ගොස් හා මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත සීමිත ප්‍රොබේට් බලපත්‍රය ලැබී වසර 14 ක් ඉක්ම ගියද විගණන දින වන විටත් මෙම බූදලයේ ඉඩම් ප්‍රමාණය මැණීමක් සිදු කර මායිම් වෙන් කර ආරක්ෂිත වැටක් ඉදිකර නිරවුල් කර නොතිබුණි.

**(ii)** බූදල්කරු ජීවත්ව සිටියදී ඔහුගේ ඉඩම් සඳහා අඳ ගොවියෙකු ලෙස පත් කර සිටි තැනැත්තාවම, කුඹුරු අක්කරයක් සඳහා එක් කන්නයකට වී බුසල් 12 ක සහතික මිලට සමාන මුදලක්ද, පොල් ඉඩම වෙනුවෙන් වසරකට රු.2,500 ක් ද බැගින් බූදලයේ ආදායමට බැර කිරීමට එකඟවන පරිදි 2000 ජූලි 04 දින සිට දේපළ සඳහා බදුකරුවකු වශයෙන් මහා භාරකාරවරයා විසින් තාවකාලිකව පත් කර තිබුණද විධිමත් බදු ගිවිසුමකට එළඹී නොතිබුණි.

**(iii)** නිරන්තරයෙන් වගා පාළු වූ බව දක්වමින් වගාකළ කුඹුරු අක්කර ප්‍රමාණය අඩුවෙන් දක්වා ප්‍රවේණි ගෙවීම් අවම කර ගැනීමට ඉහත අඳ ගොවියා ක්‍රියා කර තිබුණි. ප්‍රවේණි ලැබීම නිවැරදිද යන්න සම්බන්ධයෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් කිසිදු අවස්ථාවක අධීක්ෂණයක් හෝ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**(iv)** 2016/17 මහ කන්නය සඳහා අඳ ගොවියාගේ ගණනය කිරීම අනුව ගෙවිය යුතු රු.289,308 ක ප්‍රවේණියෙන් රු.200,000 ක් පමණක් ගෙවා තිබූ අතර රු.89,308 ක් වූ ඉතිරි මුදල 2017 වර්ෂය අවසන් වන විටත් ගෙවා නොතිබුණි.

**(v)** පොල් ඉඩමේ වපසරිය දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව තහවුරු කරගෙන නැතත් වර්තමානයේ ගොඩ ඉඩම් සඳහා රු.3,000 ක් අඳගොවියා ගෙවන බව ගොණු අනුව සනාථ විය. දෙපාර්මේන්තුවේ විමර්ශන නිලධාරියාගේ වාර්තාව අනුව උක්ත බූදලයට අයත් පොල් ඉඩම අක්කර 10 ක පමණ වපසරියකින් යුක්ත බව දැක්වේ. ඒ අනුව පොල් අක්කර 10 ක් සඳහා වාර්ෂිකව ගෙවන ප්‍රවේණි මුදල රු.3,000 වීම කොතෙක් දුරට සාධාරණද යන්න පිළිබඳ දෙපාර්තමේන්තුවේ අවධානයට ලක් වී නොතිබුණි.

**(vi)** මෙම බූදලය සතු, අනුරාධපුර නව නගරයේ හරිස්චන්ද්‍ර මාවතේ අංක 48/388 දරන ස්ථානයේ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිල්ල හා ඉඩම බූදල් හිමියා විසින් බදු දී තිබූ අතර, ඔහු විසින්ම බදුකරු ඉවත් කිරීම සම්බන්ධයෙන් පැවරූ නඩුවේ තීන්දුව බූදල් හිමියාගේ මරණයෙන් පසුව බූදල් හිමියාට පක්ෂව ලැබී තිබුණි. එම තීන්දුව ප්‍රකාරව උක්ත දේපළ නිරවුල් කර ගැනීමටත්, එය විධිමත්ව බදු දී නිසි ආදායම් ලැබීමටත්, ක්‍රියා නොකිරීම නිසා ඉන් කිසිදු ආදායමක් බූදලය නමින් දෙපාර්තමේන්තුවට නොලැබෙන බව නිරීක්ෂණය විය.

**(vii)** මෙම බූදලයට අයත් අනුරාධපුර පැරණි නගරයේ කුරුණෑගල පාරේ අංක 238 හා 239 දරන වෙළඳ ගොඩනැගිල්ල හා පිහිටි භූමිය සම්බන්ධයෙන් බදුකරු සමඟ විධිමත් බදු ගිවිසුමකට එළඹී නොතිබුණි. වෙළඳ වටිනාකමක් සහිත මෙම දේපළෙන් 2000 වසරේ අප්‍රේල් මස සිට කිසිදු ආදායමක් බූදලයට ලැබී නොතිබුණු අතර මෙම දේපළ සම්බන්ධයෙන් මහාභාරකාර දෙපාර්තමේන්තුව විසින් කිසිදු සොයා බැලීමක් කර නොතිබුණි.

**(viii)** බූදලයේ නීතිමය කටයුතු අවසන් නොවූවද 1999 සිට විගණිත දින දක්වා නීතිඥමහතුන් හා මහත්මීන් 07 දෙනෙකු සඳහා නීතීඥ ගාස්තු ලෙස බූදලයේ ආදායමෙන් රු.1,944,852 ක් වියදම් දරා තිබුණි. නීතිඥ ගාස්තු ගෙවීමේදී අධිකරණයේ පෙනී සිටි බවට සනාථන රහිතව ගෙවීම් කර තිබුණි. තවද අවස්ථා 5 ක දී ගෙවූ හඳුනා නොගත්

රු.136,079 ක විවිධ ගෙවීම් හා හඳුනා නොගත් රු.20,000 ක පුනරාවර්තන ගෙවීම් නිරීක්ෂණය විය.

**(ix)** මුදල්කරු මියගොස් වර්ෂ 19 ක් ද සීමිත ප්‍රොබේට් බලපත්‍රය දෙපාර්තමේන්තුවට ලැබී වර්ෂ 14 ක් ද ඉක්ම ගොස් ඇතත් මෙම බූදලය සම්බන්ධයෙන් සීමිත ප්‍රොබේට් බලපත්‍රයේ සඳහන් පරිදි මියගිය අන්තිම කැමතිපත්‍ර කරුගේ ණය හා තෙස්තමේන්තු දායාද ගෙවීමෙන්ද එකී අන්තිම කැමති පත්‍රය සීමිත ප්‍රොබේට් බලපත්‍රය අනුව ක්‍රියාවේ යෙදවීමටද එකී දේපළවල හා මුදල්වල සත්‍යවූත් සම්පූර්ණවූත් අවසාන ගිණුමක් හා දේපළ ලැයිස්තුවක් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට මහා භාරකාර තැන අපොහොසත් වීම නිසා තම බූදලය මහා භාරකාර දෙපාර්තමේන්තුවට පවරා මුදල්කරු බලාපොරොත්තු වූ අපේක්ෂාවන් හා අරමුණු ඉටු වී නොතිබුණි.

**(ඇ)** **මනෝහාරී සුනිල් කාන්ති මඩුගල්ල දේපළ කළමනාකරණය**

මනෝහාරී සුනිල්කාන්ති මඩුගල්ල නැමති රෝගී තැනැත්තියගේ දේපළ භාරකරු සහ කළමනාකරු ලෙස මහා භාරකාරවරයා පත් කර තිබුණි. 1972 ජනවාරි 26 දිනැති අංක 25718 දරන තෑගි ඔප්පුව හා උපලේඛනය ප්‍රකාරව අක්කර 25 රූඩ් 03 ක වපසරියකින් යුත් කුඹුරු හා ගොඩ ඉඩම් උක්ත දේපළට අයත්ව තිබුණි. දේපළ කළමනාකාරීත්වය මහා භාරකාරවරයාට පැවරෙන අවස්ථාව වන විට අඳ ගොවීන් විසින් එම කුඹුරු සඳහා ගෙවිය යුතු අඳය මැල්සිරිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ තැන්පත් කෙරෙමින් පැවතුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** දේපළ මහා භාරකාරවරයාගේ කළමනාකාරීත්වයට පත් වීමට පෙර කුඹුරු ඉඩම් වෙනුවෙන් අඳ ගොවීන් විසින් මැල්සිරිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ගෙවීම් කරන ලද මුදල්, එම ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් අධිකරණයේ අදාළ නඩුවේ බැරට තැන්පත් කර තිබුණු බව ගොනු අනුව සනාථ වුවද එම මුදල් උක්ත දේපළ කළමනාකරණය නමින් මහා භාරකාර තැන වෙත ලබා ගැනීමට මහා භාරකාර දෙපාර්තමේන්තුව විගණිත දින වන විටත් අපොහොසත් වී තිබුණි. මේ සම්බන්ධ නඩු කටයුතු වෙනුවෙන් අදාළ නීතිඥවරයාට අවස්ථා තුනකදී රු.20,500 ක් ගෙවීම් කර තිබුණි.

**(ii)** 2014 වර්ෂය සඳහා රු.80,648 ක මුදලකුත් 2015 වර්ෂය සඳහා රු.142,700 ක මුදලකුත් ලෙස එකතුව රු.223,348 ක මුදලක් ප්‍රවේණිය සඳහා ලැබූ බව මැල්සිරිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් මහාභාරකාරතැන වෙත සනාථකර තිබුණි. ඉන් රු.134,419 ක් පමණක් මහා භාරකාර තැන වෙත 2015 ඔක්තෝබර් 09 දින ගෙවා තිබූ අතර විගණිත දින වන විටත් හිඟ මුදල වූ රු.82,228 මනෝහාරී සුනිල්කාන්ති දේපළ කළමනාකරණ ගිණුමට ලබාගැනීමට මහා භාරකාර දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද 2016 යල හා 2016/17 මහ කන්න සඳහා කිසිදු මුදලක් විගණිත දින වන විට දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි. බූදලයට අයත් අක්කර 25 රූඩ් 03 ක් වූ මුළු ඉඩමේ සත්‍ය ආදායම පිළිබඳව හා කුඹුරු ඉඩම් වල සත්‍ය ආදායම තක්සේරු කර දේපළෙන් නිසි ලෙස අඳ ගොවි ආදායම් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(iii)** අදාළ කාන්තාව මිය ගොස් විගණිත දිනට වර්ෂයකුත් මාස 8 ක් ගතවුවද, ඇයගේ අභාවය ගරු අධිකරණය වෙත තහවුරු කර කළමනාකරණයට අයත් දේපළ නිදහස් කළ යුතු ආකාරය පිළිබඳව අධිකරණ නියෝගයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 34.831 | 34.269 | 0.562 | 2 |
| | මූලධන | 3.640 | 1.746 | 1.894 | 52 |
| | **එකතුව** | **38.471** | **36.015** | **2.456** | **6** |
| 2014 | පුනරාවර්තන | 36.488 | 36.405 | 0.083 | 0.2 |
| | මූලධන | 1.917 | 1.723 | 0.194 | 10.1 |
| | **එකතුව** | **38.405** | **38.127** | **0.278** | **0.7** |
| 2015 | පුනරාවර්තන | 45.450 | 42.117 | 3.333 | 7.2 |
| | මූලධන | 2.905 | 2.727 | 0.178 | 6.8 |
| | **එකතුව** | **48.355** | **44.844** | **3.511** | **7.2** |
| 2016 | පුනරාවර්තන | 45.015 | 44.469 | 0.546 | 1.2 |
| | මූලධන | 2.345 | 2.312 | 0.033 | 1.4 |
| | **එකතුව** | **47.360** | **46.78** | **0.579** | **1.2** |
| 2017 | පුනරාවර්තන | 49.475 | 49.031 | 0.443 | 0.8 |
| | මූලධන | 3.177 | 3.171 | 0.006 | 0.2 |
| | **එකතුව** | **52.652** | **52.202** | **0.450** | **0.8** |

## 2.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවට බුදල් වී ඇති වතු 12, නිවාස දේපළ, වාහන යනාදිය ඇතුළත්වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | ආයෝජන ලේඛනය | 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 හි 4.2 (ඊ) ඡේදය | ගිණුම් අංශය මඟින් පොදු ආයෝජන ලේඛනයක් නඩත්තු නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාර බූදල් ලේඛන | 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 හි 4.2 (ඊ) ඡේදය | අක්‍රීය භාර, සක්‍රීය භාර හා වසා දැමූ භාර හඳුනා ගැනීමට හැකිවන පරිදි භාර බූදල් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**2.8 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව යටතේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණි. හඳුනා ගන්නා ලද විගණන ක්ෂේත්‍ර 18 ක් යටතේ අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුනද එම ක්ෂේත්‍රයන්ගෙන් ක්ෂේත්‍ර 03 කට අදාළ කාර්යයභාරයන් ඉටුකර නොතිබුණි.

**2.9 විගණන හා කළමනාකරණ කමිටුව**

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**2.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 31.977 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 00 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 59 | 47 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 12 | 05 |
| | එකතුව | 84 | 65 | 19 |

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 19 ක් පැවති අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ, අවශ්‍ය පරිදි අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගෙන් නිලධාරීන් 51 ක් කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු බව නිරීක්ෂණය විය.